**ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - 2023**

---------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ (''මධ්‍යස්ථානය'') 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය ප්‍රකාරව, අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායමෙන් වියදම් හිලව් නොකළ යුතු වුවත්, මධ්‍යස්ථානය විසින් රු.90,785,732 ක වියදම ආදායමට හිලව් කර තිබුණි. | තාක්ෂණික පැවරුම් වාණිජ ව්‍යාපෘති වියදම් ගිණුම්වලට වියදමක් ලෙස හර කර උපකරණ භාවිතා ආදායම් ගිණුමට (Equipment Usage Income) බැර වන අගය, වියදම් ගිණුමෙන් හිලව් නොකර ආදායම් මූලාශ්‍ර යටතේ ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුව ගිණුම් සකස් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 හා 75 වන ඡේද ප්‍රකාරව වත්කමක ඵලදායී ජීවකාලය හා ක්ෂය ක්‍රමය, අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කර අපේක්ෂා කරන තත්ත්වයන් ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු නමුත්, මධ්‍යස්ථානය සතු පිරිවැය රු.639,670,381 ක වත්කම් | ආයතනයේ ගිණුම් තුල මේ වන විට සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති නමුත් භාවිතයට ගත හැකි ඵලදායී මට්ටමක පවතින වත්කම් හඳුනා ගෙන නැවත සමාලෝචනය කර ගිණුම්ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ගිණුම් සකස් කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් ඵලදායී ජීවකාලය සමාලෝචනය කර ඇස්තමේන්තු වෙනස ගිණුම්ගත කිරීමට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී මධ්‍යස්ථානය වෙත ලැබී තිබූ වටිනාකම රු. 1,144,250 ක් වූ මුදල හා ස්ථාවර වත්කම ගිණුම්ගත කර නොතිබුණි. | 2023 නොවැම්බර් 17 දාතමින් යුතු මෙම ඉන්වොයිසිය 2024දී ලැබී තිබුණි. එවැනි අඩුපාඩු ඉදිරියේදී සිදු නොවීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාළ සියළු වියදම් හා මිළදී ගැනීම් ආවරණය කර ගිණුම් සකස් කළ හැකි පරිදි සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමයන් ස්ථාපිත කිරීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,166,999 ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 22,523,175 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.34,690,174 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජය විසින් ලබාදෙන පුනරාවර්තන ප්‍රදාන රු. 52,927,327 ක් හා විලම්භිත ආදායම් රු. 68,722,801කින් අඩුවීමට සාපේක්ෂව ක්ෂයවීම් රු. 25,727,209 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමාණවත් මානව සම්පත් නොමැතිවීම හේතුවෙන් දත්ත පිවිසුම් හා පාලන වේගය සඳහා ජංගම යෙදුම සමග බහු ආදාන දුරස්ථ දත්ත ලබා ගැනීමේ පද්ධතිය සඳහා වන ව්‍යාපෘතිය (Multi input Remote Data Acquisition system with mobile App for data logging and control phase 1) හා බැටරි ආරෝපණ යෙදවුම් සඳහා බැටරි චාජරයක් සංවර්ධනය සඳහා වන (Development of a Battery charger for Battery charging Applications) පර්යේෂණ ව්‍යාපෘතීන් තාවකාලිකව නැවැත්වීම හේතුවෙන් දරන ලද වියදම අනාර්ථික ගණුදෙනුවක් විය. | අදාල ක්ෂේත්‍රයන්හී දැනුම ඇති ඉංජිනේරුවරුන් ප්‍රමාණවත් නොවන බැවින් ද පර්යේෂණ ව්‍යාපෘති සඳහා ආයතනය උපයාගත් අරමුදල් භාවිතා කිරීමට සිදුවූ බැවින්, වඩාත් වානිජමය ශක්‍යතාවයන් ඇති ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබාදීම හේතුවෙන්ද පළමු ව්‍යාපෘතිය තාවකාලිකව නවතා දැමීය. දෙවන ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට මේ වනතුරු තීරණය කර නොමැති වුවත් මේ සඳහා රු.582,446 කට ආනයනය කරන ලද ඉලොක්ට්‍රොනික උපාංග ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයේ | ව්‍යාපෘතියක් සඳහා මුදල් වියදම් දැරීමට ප්‍රථම එහි ඵලදායීතාවය පිළිබඳ සුදුසු ඇගයීමක් හෝ ශක්‍යතා අධ්‍යනයක් හෝ සිදුකළ යුතු බව |

| | | | |
|---|---|---|---|
| | | වෙනත් ව්‍යාපෘති සඳහා භාවිතා කල හැකි අතර ඉන් ලබාගත් දැනුම හා පලපුරුද්ද මේ වන විට වෙනත් ව්‍යාපෘතීන් සඳහා භාවිතා කරමින් පවතී. | |
| **(ආ)** | මධ්‍යස්ථානයට අයත් වාහන රාජකාරී කටයුත්තකට යොමු කිරීමෙන් තොරව පැවති අවස්ථාවලදී එනම් කුලී රථ ලබා ගැනීමේ අවශ්‍යතාවයක් නොතිබුණ ද 2023 ජූලි මාසය වෙනුවෙන් රු.176,992 ක වියදමක් කුලී රථ සඳහා දරා තිබුණි. | ආයතනයේ විවිධ වාණිජ ව්‍යාපෘතීන් සඳහා කුළීරථ ධාවනයට එක්කර ගැනීම අදාල වර්ෂයේදි ලංසු කැඳවා සිදුකරනු ලබයි. පසුගිය දෙසැම්බර් සිට 2024 පෙබරවාරි දක්වා ආයතනයේ විවිධ ව්‍යාපෘතීන් සඳහා කුලීරථ යොදාගෙන ඇත. මේ අනුව 2023 ජූලි මස කුළී රථ සඳහා වැයකර ඇති යැයි කියන රු.176,992 ක මුදල් සාමාන්‍ය වැය වීමක් බව සඳහන් කරමි. තවද, මෙම රථවල මුදල් අදාල ව්‍යාපෘතියට සම්බන්ධ අංශය මගින් අයකර ගෙන ඇත. දූර ගමන් සේවා ව්‍යාපෘතිවලට ආයතනයේ ඇති වෑන් රථ යොදවා ගැනීමට බොහෝවිට නොහැකි වන්නේ ආයතනය තුළ එදිනෙදා රාජකාරි (කෙටි ගමන්) සහ නිලධාරී ප්‍රවාහනයට මෙම වාහන යොදා ගැනීමත්, ප්‍රමාණවත් තරම් රියදුරන් ආයතනයේ නොමැති නිසාත්ය. | වියදම් දැරීමේදී සැමවිටම අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමව දැරිය යුතුය. |
| (ඇ) | මධ්‍යස්ථානය විසින් සමාලෝචිත වර්ෂයේදී රු. 360,042,769 ක ආදායමක් උපයා ඇති බව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වූවද, මෙහෙයුම් කටයුතුවලින් උපයා තිබූ ආදායම් රු.57,959,681 ක් පමණක් වූ අතර දරා තිබූ පරිපාලන, මූල්‍ය හා වෙනත් වියදම රු. 326,548.352 ක් විය. ඒ අනුව සත්‍ය වශයෙන් මෙහෙයුම් කටයුතු වලින් රු. 268,588,671 ක ඌණතාවයක් ලබා තිබුණි. | නර්ඩ් මධ්‍යස්ථානයේ පරිපාලන, මූල්‍ය සහ වෙනත් වියදම් අවම මට්ටමක පවත්වා ගැනීමට විශේෂ අවධානයෙන් කටයුතු කරන අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව මුළු වියදම (ක්ෂයවීම්) හැර සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුකර ගෙන ඇත. තවද 2023 වර්ෂයේ මෙහෙයුම් කටයුතු වලින් උපයා තිබූ ලාභය රු57,959,681. ක් වුවද 2022 වර්ෂයට සාපේක්ෂව එය ඉහල මට්ටමක පවතී. එමෙන්ම මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදන ව්‍යාපෘති ඉහල නංවා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මේ වන විට | වියදම් දැරීමේදී සැමවිටම අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමව දැරිය යුතුය. |

| | | |
|---|---|---|
| | මධ්‍යස්ථානයේ ව්‍යාපාර සංවර්ධන අංශයක් (BDC) වෙනම ම පිහිටුවා ආදායම් උත්පාදන ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබයි. | |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කළයුතු වුවත් මධ්‍යස්ථානය විසින් වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කර නොතිබුණි. එසේම එම චක්‍රලේඛය අනුව ගිණුම් වර්ෂය අවසන් වි දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යතු වුවත් 2022 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව විගණන දිනය වූ 2024 මැයි 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2022 වාර්ෂික වාර්තාවේ කෙටුම්පත දැනටමත් රේඛිය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. 2023 වාර්ෂික වාර්තාව කෙටුම්පත් කර ඇති අතර 2023 අවසාන විගණකාධිපති වාර්තාව ලැබුනු පසු රේඛිය අමාත්‍යාශයට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | නියමිත දිනට වාර්ෂික වාර්තා අදාළ පාර්ශවයන් වෙත ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි කල්වේලා ඇතුව සකස්කර සූදානම්ව තැබිය යුතු බව |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ 2023 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාකාරි සැලැස්ම හා කාර්යසාධන වාර්තාව අනුව සමස්ථ ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රතිශතය සියයට 60 පමණක් වී තිබූ අතර ක්‍රියාකාරි සැලැස්මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් 04 ක් සඳහා ප්‍රතිපාදනය කරන ලද මුළු මුදලේ වටිනාකම රු. මිලියන 60 ක් වුවද වැය කර ඇති සත්‍ය වටිනාකම රු.මිලියන 32.639 ක් හෙවත් සමස්ථ වෙන් කිරීමෙන් සියයට 54.4 ක් පමණක් වි තිබුණි. | ක්‍රියාකාරි සැලැස්මේ ක්‍රියාකාරකම් සඳහා රු.මි.60 ක ප්‍රතිපාදන 2023 වර්ෂයේ වෙන් වී තිබුණද භාණ්ඩාගාරයෙන් මධ්‍යස්ථානය වෙත නිදහස් කරන ලද මුදල රු.මි.7.6 ක් පමණි. ඒ අනුව මධ්‍යස්ථානයේ අභ්‍යන්තර ප්‍රතිපාදනද භාවිතා කරමින් ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාවට නංවමින් අදාල ප්‍රගතිය ලගා කර ගැනීමට සිදු විය. | හැකිතාක් තාත්විකව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ඊට අනුගත වීමට උත්සාහ දැරීම. |